| | | |
|---|---|---|
| 42. | ඇනිලීන්, බ්‍රෝමීන් දියර සමග ආකලන ප්‍රතික්‍රියාවකට භාජනය වී සුදු අවක්ෂේපයක් දෙයි. | ඇනිලීන්වල ඇති ද්විත්ව බන්ධන හරහා බ්‍රෝමීන් ආකලනය වේ. |
| 43 | ආවර්තයක I කාණ්ඩයේ සිට VII කාණ්ඩය හරහා මූලද්‍රව්‍යවල පරමාණුක පරිමාව වැඩි වේ. | ආවර්තයක් හරහා මෙම මූලද්‍රව්‍යවල බාහිරම කවචයට ඉලෙක්ට්‍රෝන එකතු වේ. |
| 44. | නයිට්‍රොබෙන්සීන්වලට වඩා පහසුවෙන් ටොලුයීන් නයිට්‍රෝකරණය වේ. | නයිට්‍රෝකරණ මිශ්‍රණයේ $NO_2^+$ අයන තිබේ. |
| 45. | මැටිවල ත.HCl නිස්සාරකයකට ඇමෝනියම් තයෝ සයනේට් එකතු කළ විට ලේ රතු වර්ණයක් දෙයි. | මැටිවල අපද්‍රව්‍ය ලෙස ෆෙරික් ලවණ ඇත. |
| 46. | කාබයිල් ඇමීන් ප්‍රතික්‍රියාව මගින් N-මෙතිල් ඇනිලීන් සහ ඩයිඑතිල් ඇමීන් වෙන් කර හඳුනාගත හැක. | N-මෙතිල් ඇනිලීන් ප්‍රාථමික ඇරෝමැටික ඇමීනයකි. |
| 47 | නිෂ්ක්‍රීය වායු අතරින් ඉහළ ම පළමු අයනීකරණ ශක්තිය ඇත්තේ හීලියම්වලට ය. | හීලියම්වල ඇත්තේ එක 1s ඉලෙක්ට්‍රෝනයක් පමණකි. |
| 48 | පිනොල්ප්තැලීන් භාවිතාවෙන් $Na_2CO_3$ ද්‍රාවණයක් සහ $NaHCO_3$ ද්‍රාවණයක් වෙන් වෙන්ව හඳුනා ගත හැක | පිනෝල්ප්තැලීන් $HCO_3^-$ අයන සමග රෝස පැහැති වර්ණයක් දෙයි. |
| 49. | විද්‍යුත් රසායනික ශ්‍රේණියේ ඉහළ ඇති මූලද්‍රව්‍යයකට පහළ ඇති මූලද්‍රව්‍යයක ලවණ ද්‍රාවණයකින් පහළ ඇති මූලද්‍රව්‍යය විස්ථාපනය කිරීමට පුළුවන | ශ්‍රේණියේ ඉහළ කොටසේ ඇති මූලද්‍රව්‍ය පහළ ඇති මූලද්‍රව්‍යවලට වඩා ප්‍රබල ඔක්සිකාරක වේ. |
| 50. | යකඩ මත ඇති ලෝහමය සින්ක් පටලයක් මළ බැඳීම වලක්වයි. | සින්ක්, යකඩවලට වඩා විද්‍යුත් සෘණ වේ. |

51. පහත සඳහන් සංයෝගවලින් කුමක් කුරුඳු තෙල්වල තිබේද?




52. විශාල ප්‍රමාණයෙන් ඇලුමිනියම් නිස්සාරණය කිරීමේදී අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා වන්නේ පහත සඳහන් සංයෝග වලින් කුමක්ද?
(1) $Al_2O_3$ (2) $AlCl_3$ (3) $Al(NO_3)_3$ (4) $Al(OH)_3.2H_2O$ (5) $Al_2(SO_4)_3$

53. ලිමනයිට් (Limonite) නම් ඛනිජය මින් කුමක ප්‍රභවයක් විය හැකිද?
(1) ටයිටේනියම් (2) මැග්නීසියම් (3) යකඩ
(4) ඇලුමිනියම් (5) මින් එකක්වත් නොවේ.

54. කාමර උෂ්ණත්වයේ දී පහත සඳහන් සංයෝගවලින් කුමන සංයෝගයේ සංතෘප්ත ජලීය ද්‍රාවණය ඉහළම $H^+$ අයන සාන්ද්‍රණය දෙයි ද?
(1) $H_2S$ (2) NaH (3) $CaH_2$ (4) $PH_3$ (5) HI

55. Z නම් කල්පිත මූලද්‍රව්‍යයක්, ස්කන්ධ 8.03 සහ 9.01 a.m.u වූ සමස්ථානික දෙකකින් සමන්විත ව ඇති අතර ඒවායේ සාපේක්ෂ සුලබතාව පිළිවෙලින් 80% හා 20% වේ. Z මූලද්‍රව්‍යයේ සාපේක්ෂ පරමාණුක ස්කන්ධය කුමක්ද?
(1) 8.23 (2) 8.53 (3) 8.68 (4) 8.91 (5) 8.33

56. $AgNO_3$ සමග අවක්ෂේපයක් නොදෙන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?
(1) $BaCl_2$ (2) $K_2SO_4$ (3) NaOH (4) KBr (5) වැඩිපුර $NH_3$

57. බර අනුව 12.5% ක් විකිරණශීල මූලද්‍රව්‍යයක් ඇති සංයෝගයක් මිනිත්තුවකට ස්පන්දන 480 බැගින් ක්ෂය වේ. මූලද්‍රව්‍යයේ අර්ධ ජීව කාලය දින 12ක් වේ නම් සංයෝගය මිනිත්තුවකට ස්පන්දන 60 ක් පෙන්වන්නේ කිනම් කාලයකදිද?
(1) දින 72 (2) දින 24 (3) දින 36
(4) දින 48 (5) දින 60

58. PV = nRT සමීකරණය සැබෑ වායු සඳහා සත්‍ය වන්නේ
(1) ඉහළ උෂ්ණත්ව සහ ඉහළ පීඩන යටතේදීය.
(2) පහළ උෂ්ණත්ව සහ පහළ පීඩන යටතේදීය.
(3) පහළ උෂ්ණත්ව සහ ඉහළ පීඩන යටතේදීය.
(4) ඉහළ උෂ්ණත්ව සහ පහළ පීඩන යටතේදීය.
(5) ඉහත [illegible] නොවේ.

59. ජලයේ ද්‍රාව්‍ය M නම් අකාබනික සංයෝගයක් $H_2S$ සමග කළු අවක්ෂේපයක් දෙයි. අවක්ෂේපය තනුක $HNO_3$ හි දියවන අතර එම ද්‍රාවණය ජලීය ඇමෝනියා සමග අවක්ෂේපයක් ලබා දී වැඩිපුර ප්‍රතිකාරකයේ (ජලීය ඇමෝනියාවල) දිය වේ. M විය හැක්කේ කුමක්ද?
(1) $CuCl_2$ (2) $Hg_2Cl_2$ (3) $Pb(NO_3)_2$ (4) $Al_2(SO_4)_3$ (5) $FeCl_3$

60. ශිෂ්‍යයෙක් කාබනික සංයෝගයක ලැසේන් නිස්සාරකය පරිමාවෙන් අඩක් වන තුරු තනුක $HNO_3$ සමග තාවවා එයට $AgNO_3$ එකතු කොට ඉන්පසු තනුක HCl එකතු කළ පසු සුදු අවක්ෂේපයක් ලබා ගත්තේය. එම නිරීක්ෂණයෙන් කුමන නිවැරදි නිගමනය ලබාගත හැකිද?
(1) සංයෝගයේ අයනික ක්ලෝරීන් ඇත.
(2) සංයෝගයේ අයනික නොවන ක්ලෝරීන් ඇත.
(3) ක්ලෝරීන් දියර පරීක්ෂාව නොකළ බැවින් පරීක්ෂණයෙන් ස්ථිර නිගමනයක් ලද නොහැකිය.
(4) සංයෝගයේ හැලජනයක් තිබිය යුතුය.
(5) පරීක්ෂණ ක්‍රියා පිළිවෙල වැරදිය.

## රසායන විද්‍යාව II

### 'අ' කොටස - ව්‍යුහගත රචනා

1. ස්වභාවිකව නිදහස් ව පවතින X නම් මූලද්‍රව්‍යයේ ප්‍රථම අනුයාත අයනීකරණ ශක්තීන් අට පහත රූපයේ දක්වා ඇත.




(a) i. X මූලද්‍රව්‍යයේ අයනීකරණ ශක්තිවල පෙනෙන විචලන රටාව සඳහා කරුණු දක්වන්න.
ii. X මූලද්‍රව්‍යය අයත් වන ආවර්තිතා වගුවේ කාණ්ඩය අපෝහණය කරන්න.

(b) i. පරමාණුක ස්කන්ධය හිතට අඩු වන X වල හයිඩ්‍රයිඩය කාමර උෂ්ණත්වයේදී වායුවකි. X හඳුනා ගන්න.
ii. X හි බහුරූපික ආකාර, ඇතිනම් ඒවා නම් කරන්න.

(c) i. Xට තිබිය හැකි ඔක්සිකරණ අවස්ථා සඳහන් කර එක් එක් ඔක්සිකරණ අවස්ථා විදහා දක්වන උදාහරණ වශයෙන් X වල සංයෝගය බැගින් දෙන්න.
ii. X හි හයිඩ්‍රයිඩය සහ වායුමය සල්ෆර් ඩයොක්සයිඩ් අතර ප්‍රතික්‍රියාව සඳහා තුලිත සමීකරණයක් ලියන්න.

(d) ආවර්තිතා වගුවේ X අඩංගු වන කාණ්ඩයේ මූලද්‍රව්‍යවල ද්වි හයිඩ්‍රයිඩයන්ගේ තාපාංක විචලනයේ රටාව පහත රූපයේ දක්වන්න. තාපාංකවල නියම අගයන් Y අක්ෂයේ දැක්වීම අනාවශ්‍යය.




ඩයිහයිඩ්‍රයිඩයේ සාපේක්ෂ අණුක ස්කන්ධය

2. (a) B නම් ලවණයක හයිඩ්‍රේටයේ ජලීය ද්‍රාවණයක් ජලීය සෝඩියම් කාබනේට් ද්‍රාවණයක් සමග ප්‍රතික්‍රියා කරවූ විට කාබන් ඩයොක්සයිඩ් පිට කරයි. ලවණ හයිඩ්‍රේටයේ ප්‍රමාණාත්මක විශ්ලේෂණයෙන් පහත සඳහන් ප්‍රතිඵල ලැබුණි. එහි බර අනුව (w/w) සංයුතිය Na=10.07%, S = 14.06%, H = 5.74% සහ O = 70.13% (නිර්ජලීය B ලවණයේ සාපේක්ෂ අණුක ස්කන්ධය 120ක් වේ. සාපේක්ෂ පරමාණුක ස්කන්ධ; (Na = 23; S=32, O = 16, H = 1)
ලවණ හයිඩ්‍රේටයේ අඩංගු ස්ඵටික ජලය ප්‍රතිශතය ගණනය කරන්න.

(b) පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| සංයෝගය | අණුවේ හැඩය | එකසර ඉලෙක්ට්‍රෝන යුගල සංඛ්‍යාව |
|---|---|---|
| $BeCl_2$ | | |
| $BCl_3$ | | |
| $NH_3$ | | |
| $CCl_4$ | | |
| $H_2O$ | | |

(c) පහත සඳහන් ඒවා තුළින් ඇමෝනියා වායුව යැවීමේදී සිදු වන [illegible] සමීකරණ ලියන්න.

www.sinhalalibrary.com
Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

i. රත්වූ CuO
ii. ක්ලෝරීන් දියර
iii. ජලීය $CuSO_4$ ද්‍රාවණය
iv. සිල්වර් නයිට්‍රේට් ජලීය ද්‍රාවණය

3. (a) C H සහ O පමණක් අඩංගු Y නම් කාබනික සංයෝගයක එක මවුලයක් සම්පූර්ණයෙන් දහනය වූ විට $CO_2$ මවුල හතරක් සහ ජලය මවුල හතරක් ලබා දෙයි. 2,4-ඩයිනයිට්‍රොපිනයිල්හයිඩ්‍රසීන් ප්‍රතිකාරකය සමග Y අවක්ෂේපයක් නොදෙන අතර ලෝහමය සෝඩියම් සමග ප්‍රතික්‍රියා කළ විට වායුවක් පිට විය Y සිස් ට්‍රාන්ස් සමාවයවිකතාව දක්වයි. Yට තිබිය හැකි ව්‍යුහයන් සහ එහි IUPAC නාමය දෙන්න. (Y හි සාපේක්ෂ අණුක ස්කන්ධය-72; සාපේක්ෂ පරමාණුක ස්කන්ධ: C=12; O=16; H = 1)

(b) රසායනික පරීක්ෂා පමණක් භාවිතා කරගෙන පහත සඳහන් යුගල වල ඇති සංයෝග දෙක එකිනෙකින් වෙන් කර හඳුනා ගන්නේ කෙසේද?

i. ප්‍රොපින් සහ 2-බියුටයින් (2 butyne)
ii. ෆෝර්මැල්ඩිහයිඩ් සහ බෙන්සැල්ඩිහයිඩ්

(c) $NaNO_2/HCl$ කුමන තත්ත්ව යටතේ කුමන අයුරින් ඇනිලීන් සමග ප්‍රතික්‍රියා කරයිද?

4. (a) පහත සඳහන් ඒවා තනි පියවරේ පරිවර්තන ලෙස ඔබ කෙසේ සිදු කරන්නේ ? භාවිතා කරන ප්‍රතිකාරක සහ ප්‍රතික්‍රියා තත්ත්ව දක්වන්න




iv $CH_3CH\ CHOHCH_3 \longrightarrow CH_3CH\ COONa$

(b) පහත සඳහන් ප්‍රතික්‍රියාව සඳහා යාන්ත්‍රණයක් ලියන්න.

$CH_4 + 4Cl_2 \xrightarrow{\text{හිරු එළිය}} CCl_4 + 4HCl$

(c) පහත සඳහන් ප්‍රතික්‍රියාවල ප්‍රධාන ඵලයන්ගේ ව්‍යුහ දක්වන්න




iii. තෘතීය බියුටයිල්ක්ලෝරයිඩ් $\xrightarrow{\text{Mg/ වියළි ඊතර්}}$ ? $\xrightarrow{\text{MeOH}}$ ?

iv. එතිලීන් $\xrightarrow[\Delta]{\text{පෙරොක්සයිඩ්}}$ ?

"ආ" කොටස - රචනා

5. (a) රවුල්ගේ නියමය ප්‍රකාශ කොට සැබෑ ද්‍රාවණ කුමක් නිසා සහ කෙසේ මෙම නියමයෙන් අපගමනය වන්නේ දැයි උදාහරණ දෙමින් පහදු දෙන්න.

(b) i. හුමාල ආසවනයේ මූලධර්ම සහ එහි ඇති වාසි පහදු දෙන්න.

ii. ජලයේ අද්‍රාව්‍ය A නම් ද්‍රව්‍යයක් සහ ජලයේ මිශ්‍රණයක් හුමාලය යැවීමෙන් ආසවනය කරන ලදී. වායුගෝල එකක බාහිර පීඩනයක් යටතේ මිශ්‍රණය 372 K හිදී නටන ලදී. ආසවනයෙන් එකතු වූ කොටසේ බර අනුව ජලය කොටස් පහකට A ද්‍රව්‍යයේ එක කොටසක් තිබුණි. 372 K හිදී ජලයේ වාෂ්ප පීඩනය රසදිය මි. මී. 733 ක් වේ නම් A හි සාපේක්ෂ අණුක ස්කන්ධය කුමක්ද? (එක වායු ගෝල පීඩනයක් රසදිය මි. මී. 760; සාපේක්ෂ පරමාණුක ස්කන්ධ ; H = 1 ; O = 16)

6. (a) මේවායේ අර්ථ දක්වන්න.

i. දහන තාපය
ii. බන්ධන ශක්තිය

(b) ඊතේන් ($C_2H_6$) ග්‍රෑම් 0.030 ක් සම්පූර්ණයෙන් දහනය වූ විට කිලෝ ජූල් 1.538 ක් මුදාහරින ලදී අතර ප්‍රොපේන් ($C_3H_8$) ග්‍රෑම් 0.044 ක් සම්පූර්ණව දහනය වී කිලෝ ජූල් 2.199 ක් මුද හරින ලදී. පහත දී ඇති දත්ත ද උපයෝගී කර ගෙන C-C සහ C-H බන්ධන වල සාමාන්‍ය බන්ධන ශක්ති ගණනය කරන්න.

$O_2(g) \rightarrow 2O(g),\ \Delta H = 498\ kJ\ mol^{-1}$

$CO_2(g) \rightarrow C(s) + 2O(g),\ \Delta H = 1607\ kJ\ mol^{-1}$

$H_2O(g) \rightarrow 2H(g) + O(g),\ \Delta H = 971\ kJ\ mol^{-1}$

(c) ද්‍රාව්‍යතා ගුණිතය යනු කුමක්ද?

කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ්වල ද්‍රාව්‍යතා ගුණිතය නිර්ණය කිරීම සඳහා ක්‍රමයක් විස්තර කරන්න.

7. (a) රසායනික සමතුලිතතාව යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(b) 0.60 M ($mol\ dm^{-3}$) වූ ජලීය ඇසිටික් අම්ල ද්‍රාවණයකින් $40.0 cm^3$ සමග ජලයේ අමිශ්‍ර L නම් කාබනික ද්‍රව්‍යයක $10.0 cm^3$ සොලවා, එම පද්ධතිය 303K දී සමතුලිතතාවට එළඹීමට සලස්වන ලදී. එම පද්ධතියේ ජලීය ස්ථරයෙන් $10.0 cm^3$ සම්පූර්ණයෙන් උදාසීන කිරීමට 0.15 M ($mol\ dm^{-3}$) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් $30 cm^3$ අවශ්‍ය විය. පද්ධතියේ ඉතුරු කොටස ඉන්පසු රත්කොට 313 K දී සමතුලිතතාවට එළඹීමට සලස්වන ලදී. නව සමතුලිත මිශ්‍රණ යේ ජලීය ස්ථරයේ $10.0 cm^3$ සම්පූර්ණයෙන් උදාසීන කිරීමට 0.15 M ($mol\ dm^{-3}$) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් $29.5 cm^3$ අවශ්‍ය විය.

උෂ්ණත්ව දෙකේදී ජලය සහ L නම් ද්‍රවය අතර ඇසිටික් අම්ලයේ විභාග සංගුණකය ගණනය කරන්න.

(c) ඉහත දෙන ලද පද්ධතිය සමතුලිතතාඅවස්ථාවට පැමිණ තිබුනේදැයි ඔබ නිර්ණය කරන්නේ කෙසේදැයි දක්වන්න. (පරීක්ෂණාත්මක විස්තර අවශ්‍ය නොවේ.)

"ඉ" කොටස

8. (a) ආග්නේය පාෂාන (Igneous rocks) යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? ලංකාවේ පවතින ආග්නේය පාෂාණවලට උදාහරණ දෙකක් දෙන්න.

(b) වාතයේ නයිට්‍රජන් ඇති බව පෙන්වීම සඳහා පරීක්ෂණයක් යෝජනා කරන්න පරීක්ෂණයේදී ඇති වන ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.

(c) පහත සඳහන් දෑ පහදු දෙන්න.

i. හැලජනවල ද්‍රවාංක ෆ්ලුවොරීන් සිට අයඩීන් දක්වා ඉහළ නගී
ii. මොනසයිට් ඛනිජය විකිරණශීල ය.
iii. මිනිරන් ස්නේහකයක් ලෙස ක්‍රියා කරයි.

9. (a) ආවර්තිතා වගුවේ i සහ ii කාණ්ඩවල මූලද්‍රව්‍ය නිස්සාරණය කිරීමට යොදන සාමාන්‍ය ක්‍රම කෙටියෙන් දක්වන්න. එක් එක් ක්‍රමය සඳහා අදාළ උදාහරණය බැගින් දෙන්න.

(b) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්වල ඝන නිදර්ශකයක් සෝඩියම් ක්ලෝරයිඩ් සමග අපවිත්‍ර වී ඇති බව සොයා ගන්නා ලදී. එම නිදර්ශකයේ ඇති සෝඩියම් ක්ලෝරයිඩ් ප්‍රතිශතය නිර්ණය කිරීම සඳහා සුදුසු පරීක්ෂණාත්මක ක්‍රියාවලියක් ඉදිරිපත් කරන්න.

(c) පහත සඳහන් දෑ පහදු දෙන්න.

i. ලෝහමය සෝඩියම් සාමාන්‍යයෙන් තැන්පත් කර තබන්නේ පැරෆින්වලය.
ii. ලෝහමය කොපර් (තඹ) හොඳ විද්‍යුත් සන්නායකයකි.
iii. ගුණාත්මක විශ්ලේෂණ ක්‍රමයේ ii කාණ්ඩයේ ZnS අවක්ෂේප නොවේ.

10. (a) i. ශ්‍රී ලංකාවේ හිමටයිට් ($Fe_2O_3$) නිධියක් පවතී. මෙය යකඩ නිස්සාරණය කිරීමට භාවිත කළ හැකි බව යෝජනා කර ඇත. මෙම නිධියෙන් යකඩ නිස්සාරණය කිරීම සඳහා සුදුසු ක්‍රමයක් මූලධර්ම දක්වමින් ඉදිරිපත් කරන්න.

ii. මළ නොබැඳෙන වානේ (Stainless steel) සහ වීනවිච්චි (Cast Iron) වල සංයුති ආසන්න වශයෙන් දෙන්න.

(b) i. දේශීය අමුද්‍රව්‍ය භාවිතා කර, වීදුරු නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමයක් විස්තර කරන්න.

ii. පයිරෙක්ස් (pyrex), ෆ්ලින්ට් (flint) සහ ක්‍රවුන් (crown) වීදුරුවල ප්‍රධාන ...

Find more: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras